ක්‍රියාවට නැංවේ.

මේ බදු සහන සහ බදු ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළ ගැන ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය විසින් නිකුත් කර තිබූ නිවේදනයේ සඳහන්ව ඇති මේ කරුණු තුළින් මේ බදු සහන ලබා දීමේ රජයේ අරමුණ පැහැදිලි වන අතර එසේම රජය කියන්නේ මේ නිසා භාණ්ඩ හා සේවා මිල ගණන් අඩු වනු ඇති බවයි. සාමාන්‍ය ජනයා මේ බදු සහන නිසා විශාල බදු මිල අඩු වීමක් සිදු වනු ඇතැයි අපේක්ෂා කළත් එවැන්නක් තවමත් සිදුව

තියෙනවා. ඒ වගේ ම සුවිශේෂ නායකත්වයක් ලැබිල තියෙනවා.

ඒ වගේම 2014 ඉඳල 2019 දක්වා කාලය තුළ බදු දෙගුණ වෙලා තියෙනවා. එහෙම කරල ලබා ගත්ත බදු මුදලත් හරියට ජනතා සේවය වෙනුවෙන් ගලාගෙන ගියේ නෑ. වංචා දූෂණ නිසා ඒක අපට අහිමි වෙලා ගියා. අපි පළමු පියවර විදියට බදු බර අඩු කළා. ඒ අඩු කිරීම නිසා අහිමි වෙන ආදායම ලබා ගැනීමේ පියවරක් විදියට රජයේ වියදම් අඩු කිරීමට අපි පියවර අරගෙන තියෙනවා. සියලුම ව්‍යවසායකයන්ට අප ආරාධනා කරනවා ඔබේ ව්‍යාපාර කටයුතු කරගෙන යන්න. අපට ඉදිරියේ දී ආයෝජන අවස්ථා රැසක් ලැබෙයි. දේශීය වගේ ම විදේශීය ආයෝජකයන්ට දිරි දෙන ආකාරයේ ආයෝජන ප්‍රතිපත්ති අපි හඳුන්වා දෙනවා.

රජයේ ප්‍රයත්නය වී ඇත. රාජ්‍ය යාන්ත්‍රණය තුළ ශක්තිමත් රාජ්‍ය මූල්‍ය විනයක් පවත්වා ගෙන යෑම සහතික කිරීම සඳහා ක්‍රියාමාර්ග බොහෝමයක් සැලසුම් කර ඇති අතර එමඟින් රාජ්‍ය සම්පත් ඵලදායී ලෙස භාවිත වීමට අමතරව රාජ්‍ය මූල්‍ය වගකීම ද සහතික කර ගැනීම රජයේ අපේක්ෂාවයි.




රජයේ ක්ෂණික ප්‍රමුඛතාව වන්නේ ගොවි ප්‍රජාවගේ ජීවනෝපාය වැඩි දියුණු කිරීම සහ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා කෘෂිකාර්මික අංශය දැනට පවත්නා යහපත් කාලගුණය හේතුවෙන් පූර්ණ ධාරිතාවකට ගෙන ඒමට අවශ්‍ය සැලසුම් ක්‍රියාත්මක කිරීමයි. සංචාරක ව්‍යාපාරය, තොරතුරු තාක්ෂණ සේවා, ඉදිකිරීම් හා දේපොළ වෙළෙඳපොළ, අපනයනය හා ග්‍රාමීය කෘෂිකර්මාන්තය සහ වෘත්තිකයන් වෙනුවෙන් විදේශයන්හිදී කළ ඉපැයීම් සඳහා ලබා දී ඇති සහනයන් මිල ස්ථායිතාවයකින් යුතු යහපත් ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීමට අපේක්ෂිතයි. පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායයන් ලාභ ලබන ව්‍යාපාර බවට හැරවීමට, සුදුසුකම් ලත් හා දක්ෂ පුද්ගලයින් සොයා ගැනීමේ අරමුණින් විශේෂ කමිටුවක් විසින් මෙහෙයවනු ලබන තේරීම් ක්‍රියාවලියක් හරහා රාජ්‍ය හිමිකාර ව්‍යාපාරවල ප්‍රධාන තනතුරු සඳහා පත්වීම් ලබා දීමට කටයුතු යොදා ඇත. අදාළ රාජ්‍ය ආයතනවලට නුසුදුසු අය පත් කිරීම වැළැක්වීමට එවැනි පියවරක් ගැනීම අගය කරන නමුත් එම විශේෂ කමිටුව නියෝජනය කරන අය අතර දුම්කොළ සමාගමේ හිටපු සභාපතිවරයෙක් ද සිටින බවක් දැනගන්නට ඇත. දුම්වැටිය නිසා වසරකට 15000 - 20000 ත් අතර ප්‍රමාණයක් මිය යන අතර තවත් විශාල පිරිසක් රෝගී වෙයි. මේ නිසා මේ දුම්වැටි ත්‍රස්තවාදය කොටි ත්‍රස්තවාදයටත් වඩා භයානක එකකි. එසේම සහරාන්ගේ ඉස්ලාම් ත්‍රස්තවාදයටත් වඩා අතිශය භයංකරය. ඊට අමතරව මේ රටේ අඩු ආදායම්ලාභී සහ මධ්‍ය පාංතික බහුතර ජනයාගේ මුදල් රුපියල් කෝටි ගණනක් සෑම වසරකම පිටරටට ඇදී යයි. මෙවැනි දුම්කොළ කර්මාන්තයට අනුබල දුන් අයෙකු රජයේ මෙවැනි තනතුරකට පත් කිරීම ගැන මත්ද්‍රව්‍ය විරෝධී පාර්ශ්වයේ විරෝධය එල්ල වී ඇති බවද කිව යුතුය.